# කොසොල් රජතුමා දුටු
# සිහින 16




සම්පාදක

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

ශ්‍රී ලුම්බිණි විවේක සේනාසනය, කොස්වත්ත, උතුරු තලංගම.

# කොසොල් රජු දුටු
# සිහින දහසය

## අංක : 14

සම්පාදක

**පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි**

2557 මැදින් පුරපසළොස්වක පොහෝ දින

# ඇගැයුම් වදන

කොසොල් මහ රජතුමා දකින ලද, බුදුරජාණන් වහන්සේ විසින් ඒවාට අර්ථකථන දේශනා කරන ලද ඒ ඓතිහාසික සිහින දහසය අලලා පූජ්‍යපාද අකුරේගොඩ රතනසාර ස්වාමීන් වහන්සේ විසින් සම්පාදනය කරන ලද මෙම ධර්ම ග්‍රන්ථය ඉතාම කාලෝචිත ධර්ම දනයකි. මෙම පොත වනාහි 'ඔන්න කළියුග කාලයේ පහළ වෙන පාලකයින්ගේ හැටි, සැබෑවක්ම තමා අද මනුෂ්‍යයෝත් අන්තයටම පිරිහිලා, අද සිද්ධ වෙන්නේ බුදුන් දෙසූ ඔය දේවල්ම තමා' කියා තම සිත් සතන්හි තැම්පත් වී පවතින ආවේගයන් පිට කරගෙන හුදු තෘප්තියක් ලැබීමට ඉවහල් කර ගත යුත්තක් හෝ 'ඕවා ඔහාම තමා' කියා උපේක්ෂා වී නිශ්ශබ්ද විය යුත්තක් හෝ නොවෙ. ඒ මන්ද යත් මේ දෙසුම් මාර්ගය වනාහි, අසවළුන් මෙසේ යැයි අනුන්ට ඇඟිල්ලක් දිගු කර අපි කිසිදු පළුද්දක් නැති සුද්ධවන්තයන් සේ සලකාගෙන සිටීමට හෝ අනුන් දෙස වපරැසින් බැලීමට හෝ උගන්වන දේශනාවක් නොවන නිසා ය. මේ දහම් මග වනාහි අපට අප ගැනම සිත සිතා ධර්මානුධර්ම ප්‍රතිපදවෙහි යුහුසුළු වීම සඳහාම කියාදෙන මාර්ගෝපදේශනයකි.

අප ගතකරන වර්තමානය බුදුරජාණන් වහන්සේ වදළ ඒ කළියුගයට හෙමින් සීරුවේ පා නගමින් සිටිනවා විනා තවම ඒ තත්ත්වයට ලෝකය සම්ප්‍රාප්ත වී නොමැත. තව ඉදිරියට ලොව තව තවත් පාපිෂ්ඨ වනු ඇත. මනුෂ්‍යා'යුෂ අඩුවීම, පාපය සහ පාපියෝ වැඩිවීම හේතුවෙන් ඉදිරි ලෝකය මිනිස් වෙසින් සිටින තිරිසන් සතුන් වැනි මිනිස් ප්‍රජාවකින් සමන්විත වෙනවා ඇත. එකලට ඉතාම ධාර්මික යැයි සම්මත වන මිනිසා ද අද අතිශය අධාර්මික යැයි සමාජය සම්මත කරනු ලබන පුද්ගලයන් හා සැසඳෙනු ඇති බව මාගේ පෞද්ගලික අදහසයි.

එනිසා අප සෑම දෙනාම මෙයින් ලබන දහම් දැනුම තම තමා පෞද්ගලිකව තම අභ්‍යන්තරික ජීවිතයට සමීප කර තබා ගනිමින් සසර බිය උපදවා ගැනීමටත් ධාර්මික ජීවනාභිවෘද්ධිය සපයා ගැනීමටත් ලැබුණ මාහැඟි උපදෙසක් ලෙස දැක සත්පුරුෂ ගුණයෙන් දියුණු වී මෙවන් අභාග්‍යසම්පන්න අත්දැකීම් වලට මුහුණ දීමට කලින් සසරින් එතෙර වීමට වහ වහාම උත්සාහවන්ත විය යුතුය.

**පූජ්‍ය නවගත්තේගම සුගතවංස ස්වාමීන් වහන්සේ**
ධම්මාරාම යෝගාශ්‍රමය, උග්ගල්බොඩ, ගම්පහ.

2013 ඔක්තෝබර්

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස.../// **

තුන්ලෝකාග්‍ර වූ තථාගත සම්මා සම්බුදු රජාණන් වහන්සේ වෙත එළැඹි සාතාගිර නම් යක්ෂ සේනාධිපති තුමා **නමෝ** කියා වන්දනා කළේ ය. රාහු අසුරේන්ද්‍ර තෙමේ භාග්‍යවතුන් වහන්සේට **තස්ස** කියා වන්දනා කළේ ය. සතර වරම් දෙව් රජ දරුවෝ **භගවතෝ** කියා වැන්දහ. ශක්‍ර දේවේන්ද්‍රයන් වැන්දේ **අරහතෝ** කියා ය. **සම්මා සම්බුද්ධස්ස** කියා මහා බ්‍රහ්මයා වැන්දේ ය.

**නමස්කාර පාඨය සැකසී තිබෙන්නේ එසේ ය.**

සුවයෙහි මිහිරත් ආශ්වාදයත් දන්නා වූ දුකෙහි ආදීනව විපාක දන්නා වූ සදිව්‍ය ලෝකූපගතව දිව්‍ය සම්පත් විඳිනු කැමැත්තාට එයට මාර්ගය පෙන්වන්නා වූ, බුදු පසේබුදු මහ රහත් උතුමන් වහන්සේලා ලැබූ නිවන් සැප ලබනු කැමැති, ප්‍රේතව ඉපිද විඳිය යුතු දුක් වලකන්නා වූ, අසුර කායයෙහි මහ අවුල් වියවුල් නැති කරන්නා වූ රාජභය, චෝරභය ආදී භයෙන් රෝමකූප මාත්‍රයකට ද උපද්‍රව නොවීමට මාර්ගය පාද දෙන්නා වූ සසර දුක් ගමන අවසන් කිරීමට මාර්ගය පෙන්වා දෙන්නා වූ අති දීර්ඝ කාලාන්තරයක් පර දුක්ඛ දුක්ඛිත්තව මහා කරුණා ගුණ සම්පන්නව මෙම **සත්වයන්ට මා පිහිට නොවූවහොත් මොවුන් කවද සසර දුකෙන් මිදෙත් ද?** යනුවෙන් මහත් අනුකම්පාවෙන් සියළු සත්වයන්ට පිහිට පිණිස ශ්‍රී සද්ධර්මය දෙසා වදාළ සම්මා සම්බුදු රජාණන් වහන්සේ ට (ඉහත වාක්‍යයෙන් කී පරිදි) මම නැවතත් නමස්කාර කරමි.

සූත්‍ර පිටකයට අයත් ජාතක දේශනා අතර එන සුපින ජාතකයේ සඳහන් පරිදි පසේනදී කොසොල් මහ රජතුමා විසින් දක්නා ලද සිහින දහසයක් සහ අපගේ ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් එම සිහිනවල අර්ථය රජතුමාට අවබෝධ කර දුන් ආකාරය විස්තර කරමින් මෙම ග්‍රන්ථය සම්පාදනය කර ඇත. මනුෂ්‍යයන්ට අඩ නින්දේ දී පෙනෙන දර්ශන මාලාවකි. එය කොටස් වශයෙන් පහකට බෙදේ.

එනම් :

(01) පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සතර මහා ධාතු කිපීමෙන් ද

(02) තම සිතේ නැවත නැවත බලපවත්නා වූ මනෝභාවයන් නිසා ද


(03) ඉදිරියේ ඇතිවිය හැකි සිදුවීම් ද

(04) දෙවියන් විසින් දෙනු ලබන පණිවිඩ වශයෙන් ද

(05) යක්ෂ, ප්‍රේත, භූත ආදී තැන්වල ඉපදීමට හේතු වන අකුසල කර්ම කරන්නවුන්ට පෙනෙන අට මහ නිරයන්හි ගිනි බිය ආදී වශයෙන් ද වේ.

**මෙයින් කොසොල් මහ රජතුමාට එද පෙනුනේ අංක 03 යටතේ දක්වන ලද සිහින වර්ග යි. ඒ සිහින දහසය පිළිවෙලින් මෙසේ ය.**

# පළමු වන සිහිනය



## කොසොල් මහ රජතුමා:

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කළුපාට ගොණුන් සතර දෙනෙක් සතර දිසාවෙන් ගොන් පොරයකට එනවා දුටිමි. එය දකින මනුෂ්‍යයෝ මහත් උනන්දුවෙන් ගව සටන් දකිනු කැමැතිව එදෙස අපේක්ෂාවෙන් බලා සිටිය දී එම ගොණුන් කිසිම සටනක් නොකොට ම සතර දිසාවට විසිර ගිය හ. එය බලා සිටි මනුෂ්‍යයෝ මහත් කනස්සල්ලෙන් යුතුව නැවත තම කරමින් සිටි කාර්‍යයන් හි යෙදෙනු දුටුවෙමි'යි කොසොල් රජතුමා තමන් දුටු පළමු සිහිනය බුදු රජාණන් වහන්සේට සැළ කළේ ය.

මේ සිහිනය දුටු කොසොල් රජතුමා බුදු රජාණන් වහන්සේට මෙය සැල කිරීමට පැමිණියේ මල්ලිකා දේවියගේ උපදෙස් මත ය. මෙම විමති දනවන සිහින දුටු රජතුමා පහන් වන තුරු තැති ගත් සිතින් නොනිඳ රැය පහන් කළේ තමන්ටත් රටටත් විපතක් පෙන්නුම් කරන ලදැයි බියපත් වූ බැවිනි. එනිසා උදෑසනින්ම පුරෝහිත බමුණන් කැඳවා සිහිනයේ අර්ථ විමසුවේ ය.

එවිට පුරෝහිතයන් අවස්ථාවෙන් අයුතු ප්‍රයෝජන ගන්නා අදහසින් රජු තවත් බියට පත් කරමින් මෙයින් අනාගතයේ අතිශය

බිහිසුණු විපාක ඇති වන බැවින් ඉන් ආරක්ෂාවීම පිණිස මහා යාගයක් කළ යුතු යැයි ද ඒ සඳහා එක් වර්ගයකින් සතුන් සතර දෙනා බැගින් ගෙන මහා යාගයක් කළ යුතු යැයි කීවේ ය. මහ රජ්ජුරුවෝ ද ඊට එකඟව යාගය සඳහා අවශ්‍ය පරිදි කටයුතු කිරීමට පුරෝහිතයින්ට අනුමැතිය දුන්නේ ය.

එම අවසරයෙන් උත්සුක වූ පුරෝහිතයෝ රජ ගෙදර මහා යාග කර්මයකට සූදනම් කළෝ ය. සතුන් මරා බිළි පූජා කොට පවත්වන්නට සැරසෙන මේ පවිටු යාගය ගැන දැන ගත් මල්ලිකා දේවිය රජු වෙත ගොස් 'රජ මැදුරේ බිළි පූජා සහිතව යාගයක් පවත්වන්නේ ඇයි' දැයි රජුගෙන් ඇසුවා ය.

'ඉදිරියේ අපටත් රාජ්‍යයටත් සිදුවීමට ඇති අතිබිහිසුණු විපතක් ගැන සිහිනයෙන් පෙන්වන ලද බැවින් ඒ විපත වළකා ගනු පිණිස පුරෝහිතයන්ගේ මගපෙන් වීම යටතේමෙවන් යාගයක් පවත්වන්නේ ය' යැයි මහ රජතුමා දේවියට කීවේ ය.

රජතුමා දුටු සිහිනය තම වාසියට හරවා ගත් බමුණෝ රජු රවටා මහ විපතක් කිරීමට සැරසෙන බව තේරුම් ගත් මල්ලිකාවන්, 'මහ රජතුමෙනි අසතු මැනවි. මේ සිහිනය සුබ එකක් බවවත් අසුබ එකක් බවවත් බමුණන් දන්නේ නැත. ඔවුන් සැරසෙන්නේ සතුන් නසා බිළි පූජා කොට ඔබතුමාගෙන් බොහෝ ආහාර පාන සහ පුද පඬුරු ලැබීමටයි. මහරජාණෙනි මේ සිහිනය නිසා ඔබ තුමාටවත් රටටවත් වන විපතක් මට නම් පෙනෙන්නේ නැති නමුත් යම් හෙයකින් ඔබ මෙවැනි කෲරකමක් කළොත් නම් අපට මතුවට මහත් විපතක් වන්නේ ය. එනිසා ඒ විපත්වලින් මිදීමටත් මේ සිහිනයේ නියම පලාපලය ගැන දැන ගැනීමටත් අවශ්‍ය නම් ජේතවන විහාරයේ වැඩ සිටින භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ වෙත ගොස් අපි මේ ගැන අසමු. භාග්‍යවතුන් වහන්සේ මේ සිහිනය විසඳන්නා හ' යැයි රජුට උපදෙස් දුන් මල්ලිකාවන්ගේ මග පෙන්වීම අනුව

පුරෝහිතයන්ගේ යාගය සූදනම් වන අතරම රජු සහ දේවිය බුදු රජාණන් වහන්සේ වෙත ගිය හ. රජ යුවළ බුදු රජාණන් වහන්සේ සමඟ සතුටු සාමීචි කථා කොට නිමවා අනතුරුව කොසොල් මහ රජතුමා ඉහත සඳහන් කළ පරිදි තමන් දුටු සිහිනය ප්‍රකාශ කළේ ය.

තථාගතයන් වහන්සේ එම අවස්ථාවේ එම සිහිනය විසඳා වදළේ මෙලෙස ය.

බුදු රජාණන් වහන්සේ :

'මහ රජතුමෙනි, මෙය ඔබ තුමාටවත් රාජ්‍යයටවත් වන අනතුරක් පිළිබඳ පෙර නිමිති පෙන්වීමක් නොව කළියුග කාලයෙහි (මතු අනාගතයේ) ලෝකය අධර්මිෂ්ඨ වන්නේ ය. එකලට ගංගා, ඇළ-දොළ, වැව්-පොකුණු, පිරී ඉතිරී යන පරිදි ධාරානිපාත වැසි වසින බවට පෙර නිමිති පහළ කරමින් සතර දිසාවෙන් වැසි වළාකුළු නගින්නේ ය. එළිමහනේ වැඩ රාජකාරිවල නිරතව සිටි මනුෂ්‍යයෝ වැසි බලාරොත්තුවෙන් නොතෙමෙන ස්ථාන කරා යන්නේ නමුත් වැසි පොදකුදු නොවැටීම වැසි වළා සතර දිසාවට විසිර ගොස් අහස ආලෝකමත් වන්නේ ය. වැසි දිය අපේක්ෂාවෙන් සිටි මිනිසුන් වැසි නැති වීමෙන් ඉච්ඡා භංගත්ව දුකට පාත්‍ර වන බව මෙයින් පිළිඹිබු වන්නේ යැයි' එම සිහිනයේ අර්ථය පහද වදළ සේක.

එම සිහින ඵල විසඳීමෙන් සතුටට පත් රජතුමා යාග ක්‍රියාව නවතා දැමුවා සේම නැවත ද එවැනි අරුම පුදුම සිහින දුටු විට බුදු රජාණන් වහන්සේ වෙත එළඹ එම සිහින ඵල විසඳා ගත්තේ ය. එලෙස කොසොල් මහ රජුන් දක බුදු පියාණන් වහන්සේ විසින් විසඳා දෙන ලද සිහින විස්තරය මේ පොතේ ඉදිරියේ සඳහන් වේ.

## දෙවන සිහිනය




**කොසොල් මහ රජතුමා:**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කොස්, දෙල්, පොල් ආදී පැල වර්ග සිටුවා දින දෙක තුනක දී රියන් දෙක තුනක් උසට වැඩුන කල්හී මල් ගෙඩි හට ගෙන මාස දෙක තුනකින් අභාවයට යනවා සිහිනෙන් දුටිමි. මෙහි ඵලාපල දෙසා වදළ මැනැවි' යැයි රජතුමා ප්‍රකාශ කළේ ය.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජ, මෙය ඔබ තුමාට හෝ රජයට වන විපතක් නොවේ. මෙය කළියුග කාලයේ රජවරුත් රට වැසියෝත් අධර්මිෂ්ඨ වන්නා හ. ඒ කාලයට මිනිසුන් පාප බහුල වෙති. බොහෝ අපරාධ සිදු වේ. ඒ පාපී මිනිසුන්ගේ ආයුෂ බොහෝසෙයින් අඩු වේ. ඔවුන් අඩු වයසින් ආවාහ විවාහ වී දරු ඵල ලබා ඉතා කෙටි කලකින්ම වයස් ගත වී මිය පරලොව යන්නේ ය.' බුදු රජාණන් වහන්සේ විසින් පහද වදළ සේක.

## තෙ වන සිහිනය



**කොසොල් මහ රජතුමා:**


'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, එළදෙනක විසින් පැටවෙකු වද එම මව් එළදෙන එවේලේම තම' පැටවාගෙන් කිරි උරා බොනවා සිහිනයෙන් මා දුටිමි' යැයි රජතුමා තමන් දුටු තවත් සිහිනයක් භාග්‍යවතුන් වහන්සේට දැන්වූයේ ය.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජතුමෙනි, මෙම සිහිනයේ විපාක ද මෙකල හට ගන්නේ නොවේ. අනාගත අධර්මිෂ්ඨ සමයන්හි ම හට ගන්නේ ය. අනාගතයේ දරුවන්ට දෙමව්පියන් වැඩිහිටියන් ගැන හැඟීමක් සැලකීමක් ඇති වන්නේ නැත. මව්පියන් දූදරුවන් යහළුවන් බඳු බවට පත් වන්නා හ. දරුවන් තුළින් මව්පිය හැඟීම අතුරුදන්ව ඔවුන්ට ගරු සැලකිළි කරනු වෙනුවට අනේකවිධ හිරිහැර කරදර කරමින් බිය ගන්වා තබා ගන්නා හ. ඒ කාලයට දෙමව්පියන් දස දසියන් වැනි බවට පත්ව දරුවන්ගේ බැල මෙහෙවරකම් කරන්නට සිදුවන්නේ ය. මව්පියන්ට බෙහෙත් හේත් හෝ අනෙකුත් අවශ්‍යතාවයන් සලසා දෙන්නේ නැත.

එබැවින් ඔවුන් ඉතා අසරණව දරුවන්ට යටහත් පහත්ව ජීවත් වී අතෘප්තිකර සිතින්ම මිය යන්නා හ. මහ රජතුමෙනි මේ සිහිනයේ අනිටු විපාක අනාගතයේ ලැබෙන්නේ ය' යැයි බුදු රජාණන් වහන්සේ පහද වදාළ සේක.

## සිව් වන සිහිනය




**කොසොල් මහ රජතුමා:**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, පළපුරුදු ශක්ති සම්පන්න ගොණුන් පසෙක සිටිය දී ළදරු වස්සන් ගැල් ධූරයෙහි යොදවා කරත්ත බර ඇදීමට ඔවුන් යොදවා තිබුණි. ඒ ගොන් වස්සන් බර ඇදීමට නොහැකිව නිහඬව සිටිනු දුටුවෙමි. මෙහි විපාකය කෙබන්දක් දැයි සර්වඥයන් වහන්සේ මට වදාළ මැනැව' යැයි කොසොල් රජතුමා භාග්‍යවතුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජතුමෙනි, මෙම සිහිනයේ විපාක දැකිය හැකි වන්නේ ද මතු අනාගතයේ අල්ලස සහ දූෂණය රජ කරන කල්හි ය. එකලට අල්ලසට යටවීමෙන් සහ නැදෑකමට ගැති වීමෙන් සුදුස්සන්ට සුදුසු තැන නොදී නුසුදුස්සෝ වගකීම් දැරිය යුතු තනතුරුවලට පත්වන්නා හ. උගත් වූ කුලවත් වූ සුදුසුකම් ඇත්තෝ අසරණව පසෙකට වී කම්පාවෙන් බලා සිටින්නා හ. ඉන් රට රාජ්‍ය පිරිහී දුගී දුප්පත් වන්නේ ය. මේ ඒ වගට පූර්ව නිමිති වන්නේ ය' යැයි බුදු රජාණන් වහන්සේ කොසොල් රජතුමාට දේශනා කොට වදාළ සේක.

# පස් වන සිහිනය



### කොසොල් මහ රජතුමා:

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ශරීරයේ දෙපසින්ම ඔළු දෙකක් සහ එක බඩක් ඇති අශ්වයෙක් දෙපසින්ම ආහාර අනුභව කරනවා දුටිමි. තුන් ලොවට වැඩ කැමති වූ භාග්‍යවතුන් වහන්සේ මා හට මෙම සිහිනයේ විපාකය දෙසා වදරන සේක්වා' යැයි කොසොල් රජතුමා භාග්‍යවතුන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය.

### බුදු රජාණන් වහන්සේ :

'මහ රජතුමෙනි, මෙම සිහිනයේ සඳහන් වන්නේ මතු කළියුග කාලයෙහි පාලකයින් සහ අනෙකුත් නිළධාරීන් රජයේ වැටුප් සහ අනෙකුත් සියළුම වරප්‍රසාද භුක්ති විඳිමින් සෑහීමකට පත් නොවී අල්ලසට යටවෙති. අල්ලස ලැබෙන තුරු සිය සේවා රාජකාරී ප්‍රමාද කරති. නඩු විසඳීමේ දී විත්ති පැමිණිලි දෙපසින්ම අල්ලස් ගෙන වරදකරු නිවැරදි කරු බවටත් නිවැරදි කරු වැරදි කරු බවටත් පත් කරයි. ඉතා දරුණු වරදටත් සුළු දඬුවමක් පමුණුවයි. අල්ලසෙන් තොරව කිසිම කටයුත්තක් කර ගැනීමට සාමාන්‍ය ජනතාවට නොහැකි වෙයි. සෑම තැනම අල්ලස දූෂණයම රජ කරයි. මහ ජනතාව අතිශය පීඩාවට පත් වෙති. මහ රජතුමෙනි, මේ ඔබ දුටු එම සිහිනයේ විපාකයි' යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

### සය වැනි සිහිනය




**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මා දුටු තවත් සිහිනයකදී විශාල ජනකායක් මධ්‍යයේ මහළු සිවලෙක් අගනා රන් තළියකට මුත්‍රා කරනු දුටුවෙමි, මෙහි විපාකය ද භාග්‍යවතුන් වහන්සේ මට පහද දී වදාරණ සේක්වා' යි කොසොල් රජතුමා ඉල්ලා සිටියේ ය.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජතුමෙනි, ඔබ තුමන් දුටු මේ සිහින විපාකය ද කළියුගයෙහි වන්නේ ය. අධර්මිෂ්ඨ පාලකයෝ වැදගතුන් ගුණවතුන් ගැන සැක උපදවා තරහ වෛර උපද්දවා, සෑම විට සෑම තැනකදීම ඔවුන්ට කරදර පීඩා වන ආකාරයටම කටයුතු කරති. කිසි දැනුමක් අවබෝධයක් නැති සුරා සූදුවට දුරාචාරයට ලැදි දුෂ්ඨ පාප ක්‍රියාවල යෙදෙන අදැහැමි කම් කරමින් පාලකයන්ට ගැතිකම් කරන පුද්ගලයන්ට මුල්පුටු සහ තනතුරු දෙති. ඔවුන් එම තනතුරු නිසා මහ ඉහළින් වැජඹෙමින් කුලවත් ගුණවත් අයගේ දියණිවරුන් විවාහ කර ගනිති. ඔවුන්ගේ ධාමරික කම් සහ මිළ මුදල් නිලතල නිසාවෙන් සියල්ලන් මැඩපවත්වා ගෙන අදැහැමිකම් කරති. අර වැදගත් ගුණවත් පුද්ගලයෝ ඔවුනට බියෙන් සියල්ල ඉවසා විඳ දරා ගනිති. මහරජතුමෙනි, ඔබ තුමා දුටු එම සිහිනයේ විපාක ද මතුවට දක්නට ලැබෙන් ය.' යැයි සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් දේශනා කොට වදාළ සේක.

## පස් වන සිහිනය



**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, එක් දුගී පුරුෂයෙක් පුටුවක් මත වාඩි වී ලණුවක් අඹරමින් පහතට දමයි. පුටුව යට සිටින සිවල් දෙනක පුරුෂයාට නොදැනෙන ලෙස ඔහු වියා පහතට දමන ලණුව කා දමයි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මා විසින් මෙවැනි සිහිනයක් දකින ලදිමි. භාග්‍යවතුන් වහන්සේ මට මෙම සිහිනය ද විසඳා වදරන සේක්වා' යැයි කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජතුමෙනි, අනාගත කළියුග කාලයෙහි පාප ස්ත්‍රීහු තම ස්වාමියා උපයන ධනය විවිධ විලාසිතා කිරීම සඳහා ද නොයෙකුත් අනවශ්‍ය කටයුතු සඳහා ද නිකරුනේ විනාශ කරති. බොහෝ ස්ත්‍රීහු පරපුරුෂ සේවනයට ලොල් වී ඒ කටයුතු සඳහා ද ඒ අනියම් සැමියන්ගේ ඕනෑ එපාකම් සඳහා ද ස්වාමියා උපයන ධනය වියදම් කරති. තම

ස්වාමියා පිළිබඳව ඔවුන්ගේ කිසිදු ගෞරවයක් තැකීමක් නැත. ඔහුව පිළිකුල් කරති. ඒ පාපී කාන්තාවෝ සුරාවට සූදුවට යොමු වෙත්. ඔවුහු සොර සැමියන් ඇසුරු කරමින් තම ස්වාමියාට බොරු ගෞරව දක්වත්. වැරහැළි අඳිමින් අඟහිඟකම් පෙන්වමින් ස්වාමියා උපයන දෑ සූරාකත්. මහරජ තුමෙනි, මේ සිහිනයෙන් පෙන්වන්නේ අනාගතයේ බිහිවන පාප ස්ත්‍රීන්ගේ මෙබඳු පාපකම් පිළිබඳව ය' යැයි සම්මා බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

## අට වැනි සිහිනය



**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මාළිගාවේ දිය පුරවන සාමාන්‍ය හිස් කළගෙඩි අතර එක් විශාල කළගෙඩියක් ඇත. එහි ජලය පිරී ඉතිරී යන්නේ නමුත් මනුෂ්‍යයෝ අනෙක් හිස් කළගෙඩි දෙසවත් නොබලාම පිරී ඉතිරී යන ලොකු කළගෙඩියටම තව තවත් දිය පුරවන්නා හ. ස්වාමීනි මා මෙවර දුටු සිහිනය මෙයයි. මා කෙරෙහි අනුකම්පාවෙන් මෙම සිහිනය ද විසඳා වදාළ මැනව' යැයි කොසොල් රජතුමා සර්වඥයන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජතුමෙනි, කළියුග කාලයෙහි සත්ත්වයෝ බෙහෙවින්ම පාපකාරී වෙති. ඔවුන් අතුරෙහි පාලන බලය සහ නිළතල බලය ඇත්තෝ පොදු ජනතාව බොහෝ සෙයින් පෙළීමට පත් කරති. රජ, මැති ඇමතිවරු ධනයෙන් බලයෙන් මත් වෙති. ඔවුන්ගේ අනුගාමිකයෝ ද මහ ඇත්තන්ගේ සවිය ගෙන අධර්මයෙන් බලවත් වෙති. රටවැසියෝ ඉතා දරුණු ලෙස බදු බරින් මිරිකෙති. ඇති හැකි අයටම සියල්ලෝම ගරු කරති. සලකති. ඒ රජ, මැති ඇමතිවරුන් සහ අනෙකුත් බලවතුන් මහරජ බදු මුදලින් වැජඹෙති. ඇති තැනටම ධනය ගොඩ ගසති. මහ ජනතාව ද මහත් ඕනෑකමින් සිය කැමැත්තෙන්ම ඔවුන්ට ගැතිකම් කරති.

වැඩි දෙනෙක් මේ පාලකයන්ට වඩා අනෙක් පාලකයෝ හොඳයැයි කියා තමන් කැමැති පක්ෂයේ පාලකයන් වර්ණනා කරමින් ඔවුන්ව බලයට පත් කර ගැනීමට වෙහෙසෙති. ඔවුන් පත් වූ කල්හී සිටි අයට ද අන්ත ලෙස කටයුතු කරති. එහෙත් පාක්ෂිකයෝ ඔවුන්ව අගය කරති. විරුද්ධ පක්ෂය කෙතරම් හොඳ දේ කළත් ඒවා අගය නොකරති. යුක්තිය අයුක්තිය ගැන එකලට නොතකති. තම මතය ස්ථිර කර ගැනීමට සහ ලාභ ප්‍රයෝජන ලබා ගැනීමට පමණක් වෙහෙසෙති. සාධාරණව ජීවත් වන ගුණ ගරුක ජනයා සෑම කල්හිම රැවැටෙයි. මුලා වෙයි. බලතල ඇත්තෝ තමන්ට අවනත නොවන අයව මැර බලය සහ රාජ්‍ය බලය යොදවා මර්ධනය කරති.

මහරජතුමෙනි, මේ වනාහී මෙකල ඔබ තුමාට හෝ රාජ්‍යයට වන අන්තරාවක් ගැන පූර්ව නිමිත්තක් නොව, අනාගත කළියුගයේ දක්නට ලැබෙන දෙයක් ය' යනුවෙන් සර්වඥයන් වහන්සේ කොසොල් රජතුමාට දෑන් වූ සේක.

## නව වන සිහිනය

**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මම තවත් අරුම පුදුම සිහිනයක් දුටුවෙමි. භාග්‍යවතුන් වහන්ස, ඊට බැසීමට බොහෝ තොටුපොලවල් ඇති පස් පියුමෙන් සුසැදි සිසිල් පැන් ඇති මනහර පොකුණක් තිබේ. බොහෝ දෙපා සිව් පා සතුන් එම පොකුණට බැස දිය බොත්. ජල ක්‍රීඩා කරත්. අරුමයකි. භාග්‍යවතුන් වහන්ස, මෙම පොකුණේ මැද ප්‍රදේශයේ ජලය කැළඹිලි සහිතය. බොර පැහැති ය. අපිරිසිඳු ය. නමුත් සතුන් බසින ක්‍රීඩා කරන ප්‍රදේශයේ ජලය ඉතා පිරිසිඳු ය. කැළඹිලි රහිත ය. මෙම අරුම පුදුම සිහිනයේ විපාක කෙබඳු දැයි පහද වදරණ සේක්වා' යි කොසොල් රජතුමා බුදුරජාණන් වහන්සේට ආයාචනා කර සිටියේ ය.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජතුමෙනි, මේ සිහිනය ද වනාහී, මෙකල ඔබ තුමාට හෝ රාජ්‍යයට වන අනිටු ඵල විපාකයක් නොව මතු අනාගතයේ අධර්මිෂ්ඨ රජවරුන්ගේ කාලයේ දී සිදුවන දෙයකි. අනාගතයේ බිහි වන වෛර තරහ ඊර්ෂ්‍යා බහුල දිළිඳු ආත්මාර්ථකාමී අධාර්මික පාලකයින් අගතියෙන්ම රාජ්‍යයන් පාලනය කරන්නාහ. රට වැසියා තලා පෙලා (යන්ත්‍රයෙන් උක් දඬු මිරිකා පැණි ගන්නා වූ ආකාරයට) අධික ලෙස බදු අය කර ගන්නා නිසා නගර වැසියෝ ගම් පළාත්වලට පලා යන්නා හ. ඉන් නගරය ජනයාගෙන් හිස් වන්නේ ය. ඔබතුමා දුටු සිහිනයේ පරිදි පොකුණේ මැද කැළඹී තිබෙන්නාක් මෙන් එකලට නගරය කැළඹී මිනිසුන්ගෙන් හිස් වන්නේ ය. පොකුණේ නොකැළඹුන ප්‍රදේශය මෙන් ප්‍රත්‍යන්ත ජනපදයෝ මිනිසුන් ගෙන් පිරී ඉතිරී යන්නේ ය. මහ රජතුමෙනි, මේ සිහිනයේ ඵල විපාකයෝ මෙලෙස අනාගතයේ පහළ වන්නේ ය.' යැයි සර්වඥයන් වහන්සේ පහද වදාළ සේක.

## දස වන සිහිනය

**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ලොකු දර ලිපක් මත බත් සැළියක් ඉදෙනවා දුටිමි. සියළු පැත්තෙන්ම සමව ගින්දර නැගුනේ නමුත් බතෙහි එක් කොටසක් අමුවෙන් ද, තව කොටසක් බෙරි වී ද. ඉතිරි කොටස ආහාරයට සුදුසු පරිදි පැසී තිබුණි.'

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජාණෙනි, අනාගත කාලයෙහි අධාර්මික පාලකයින් සහ අනුගාමිකයෝ පස් පව් දස අකුසල් කරමින් නොකළ යුතු වෙළඳාම් ආදිය කරමින් ධනය උපයති. රජුන් අධාර්මික වන කල්හි මැති ඇමතිවරු ද ඔවුන් අනුව නිළධාරීහු ද ඒ අනුව පොදු මහ ජනතාව ද සපිරිවරින් අධාර්මික වන්නා හ. එසේ මිනිසුන්ගේ අදහස් වචන සහ ක්‍රියා නපුරු වන කල්හී පොළව ඇසුරු කළා වූ ද වෘක්ෂයන්ට අධිගෘහිත වූ ද දෙවියෝ සහ ලෝක පාලක දෙවියෝත් කෝප වෙති. මිනිසුන්ගේ ආරක්ෂක දෙවියෝ ඔවුන්ට පිටු පා ඉවත්ව යෙති.

එම අවදියේ දී වාතය අපිරිසිදු වෙයි. වාතය චණ්ඩව විෂම පැවතුම් පවත්වයි. කෝප වූ වස්ස වළාහක දෙවියෝ සමව වැසි එල නොපවත්වයි. කොටසකට වැසි වසී. කොටසකට නොවසී. බත් සැළිය විසමව ඉදුනාක් මෙනි.' යැයි භාග්‍යවතුන් වහන්සේ වදළ සේක. වැස්ස වසින්නේ දරුවන් අම්මේ බඩගිනියි කියනවිට ආ පුතේ මේක බොන්න කියාද වතුර තිබහයි කීවිට ආ පුතේ මේවා කන්න කියාද වර්ෂාව ඉල්ලනවිට නියඟය ද, පැවිල්ල ඉල්ලනවිට වැස්සද දෙන ආකාරයටය.

## *එකොළොස් වන සිහිනය*

**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, කහවණු ලක්ෂයක් වටිනා සඳුන් අරටුවක් කුණු මෝරු සැළියකට හුවමාරු කර ගන්නවා මම සිහිනෙන් දුටුවෙමි.'

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජ තුමෙනි, ඔබතුමා දුටු මෙම සිහිනයේ පරිදි මා විසින් නිර්වාණය පරම කොට දේශනා කොට ඇති මේ ශාසනයෙහි, මතු අනාගතයේ පැවිදි වන පාප දුස්සීල භික්ෂූහූ ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන්ම පැවිදිකම් කරති. දම් දෙසුම් සහ ආගමික වතාවත් ලාභ කීර්ති ප්‍රශංසා අපේක්ෂාවෙන්ම සිදු කරන ඔවුහු ශාසනයට අපහාස වන ආකාරයෙන්ම හැසිරෙති. ධර්මයට විනයට ගරුසරු නොකරති. ඒ පාපී භික්ෂූන් පාලකයන්ට ගැතිකම් කරති. දේශපාලනයට යොමු වෙති. සිව්පසයම ගරු කරන ඔවුන් සිල්වත් භික්ෂූන් කොන් කරති.

සැබෑ ධර්මය විනය නොදත් ගිහියෝත් පාප භික්ෂූන්ගේ පාපකම් ම අගය කරති. සිල්වතුන්ට ගරු නොකරති. මහ රජ තුමෙනි, අගනා සඳුන් හරයක් කුණුමෝරුවලට බාල්දු වන්නාක් මෙන් මතු අනාගතයේ ගුණය අගුණයට යට වන්නේ ය. පාපය සහ පාපියෝ ම බහුල වන්නේ ය. ඔවුන්ම ප්‍රබල වන්නේ ය. ප්‍රමුඛ වන්නේ ය' යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## දෙළොස් වන සිහිනය

**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මා දුටු මේ සිහිනයේ දී ලබු කැට ජලයට දැමූ සැණින් දියේ ගිලී යන්නේ ය.'

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජාණෙනි, කළියුගයෙහි පාලකයෝ උසස් වැදගත් තනතුරු දැරීමට සුදුසු උගතුන්ට නිසි තනතුරු නොදෙන්නා හ. නීච කුලිකයන්ටම නූගතුන්ටම තනතුරු දෙන්නා හ. වැදගතුන්ට සිදු වන්නේ ඒ නීචයන්ගේ එහෙයියන් වීමට ය.

මාගේ අනාගත ශාසනයෙහි ද මේ තත්ත්වය දක්නට හැකි වන්නේ ය. දුසිල් පාපී පැවිද්දන්ටම මුල් පුටු ලැබේ. හිස් ලබු කැට දියේ ගිලී යන්නාක් මෙන් හිස් පුද්ගලයෝම ශාසනයේ සහ සමාජයේ වැදගත් තැන්වල මුල් බැස ගනිති. මහ රජ මේ ඒ වගට පූර්ව නිමිති වන්නේ ය.' යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## දහතුන් වන සිහිනය

**කොසොල් මහ රජතුමා :**


'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, අති විශාල ගල් පර්වතයන් දිය මත පා වෙනවා සිහිනෙන් දුටිමි.'

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජිඳුනි, මෙයින් පෙන්නුම් කරන්නේ මතුවට සිදුවන මාගේ ශාසනයෙහි පිරිහීමත් සමාජයේ පිරිහීමත් පිළිබඳව ය. සිව් පසයට ලොල් වූ අනාගත පාප භික්ෂූන් ප්‍රසිද්ධ රැස්වීම්වලට වැද පාලකයින්ගේ සහ නිළධාරීන්ගේ ගුණ වයත්. ඒ පාලකයෝ සහ නිළධාරීහුත් ඔවුන්ව අගය කරත්. මහජනයා ද ඔවුන්ගේ ඒ කියමන් මහ ඉහළින් ගෞරවයෙන් පිළිගනිත්.

සිල්වත් භික්ෂූන් ඔවුන්ගේ අවඥාවට ලක්ව කොන් වෙත්. මෙසේ ගුණය දෙවැනි තැනට වැටී අගුණයම මුල් තැනට පත් වේ.' යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## දහ හතර වන සිහිනය




**කොසොල් මහ රජතුමා :**

'ස්වාමිනි, භාග්‍යවතුන් වහන්ස, ඉතා කුඩා මැඩි පැටවුන් ඉතා විශාල ශරීර ඇති සර්පයන් අල්ලා ගෙන 'චර-චර' යන ශබ්දය නගමින් එම සර්ප මස සතුටින් අනුභව කරනවා දුටුවෙමි'.

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජ තුමෙනි, ඔබ තුමන් දුටු මේ සිහිනයේ ප්‍රකාරව කළියුගයෙහි මිනිසුන් අධික කාමරාගයෙන් කෙලෙසුන්ට වසඟව කාමාසාවෙන් මැඩුනෝව වියපත් වූ පුරුෂයෝ ළා බාල තරුණියන් සමඟ විවාහ වෙති. එසේම වස්තු හිමි කාන්තාවන් ළා බාල තරුණයන් සමග විවාහ වෙති. වියපත් වූ එම ස්ත්‍රී පුරුෂයෝ ළා බාල වූ එම තරුණ තරුණියන්ට වසඟව වහළුන් මෙන් ක්‍රියා කරති. ඔවුන්ගේ එරවිලි ගෙරවිලි වලට බඳුන් වෙති. හේතුවක් ඇති කල්හී ද නැති කල්හී ද කරන තරවටු වලට නතු වී තමන් අතහැර යා යැයි බියෙන් ඔවුන් කෙරෙහි අවනතව වාසය කරයි. තමන්ගේ දේපල අයිතිවාසිකම් ද ඔවුන් නතු කර ගන්නා බැවින් ඒවා ගැන කිසිවක් කථා කිරීමට පවා අවසරයක් නොලබයි. කුඩා මැඩියන් විසින් සර්පයන් කා දමන්නාක් මෙන් වියපත් වූවෝ ළා බාල තරුණ තරුණියන්ගේ වසඟයට යන බවට මේ පූර්ව නිමිති වන්නේ ය' කියා තථාගතයන් වහන්සේ වදාළ සේක.

## පසළොස් වන සිහිනය




**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, රණ හංසයෝ පිරිසක් කපුටන් මැදි කර ගෙන සිටිනවා දුටුවෙමි.'

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජ තුමෙනි, මේ සිහිනය ද මෙකල් හී ඔබ තුමාට හෝ රාජ්‍යයට බලපාන සිහිනයක් නොව, මතු අනාගතයේ අනිටු විපාක උපද්දවන්නක් ය. අනාගත කළියුගයේ පහළ වන දුර්වල රජවරු තමාගේ බලය ආරක්ෂා කර ගැනීමට කිසි දැනුමක් අවබෝධයක් නැති පළපුරුදු රහිත නමුත් පාලකයින්ට ආවඩන නිකමුන් ඉදිරියේ තබා ගෙන ඔවුන්ට තැන දී කටයුතු කරති. ඉන් රට රාජ්‍ය පිරිහී යයි. රණ හංසයෝ බඳු විය යුතු පාලකයෝ මෙසේ කපුටන් බඳු වූ දුර්වලයන්ව පෙරමුණේ තබා ගනී. රජ තුමෙනි, මේ ඒ බවට පූර්ව නිමිති වන්නේ ය.' යැයි බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

## සොළොස් (දහසය) වන සිහිනය



**කොසොල් මහ රජතුමා :**

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, මා නැවත ද වරක් තවත් අරුමපුදුම සිහිනයක් දුටුවෙමි. එහි ඵල විපාක භාග්‍යවතුන් වහන්සේගෙන් විමසමි. මා කෙරෙහි අනුකම්පාවෙන් එය මට විසඳා දෙන සේක්වා.' යැයි අවකාශ ලබා ගත් කොසොල් රජතුමා සර්වඥබුදු රජාණන් වහන්සේට තමන් දුටු මෙම සිහිනය ඉදිරිපත් කළේ ය.

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, ගව, එළු, බැටළු ආදී කුඩා සතුන් සිංහ, ව්‍යාඝ්‍රාදී විශාල, නපුරු, භයංකර සතුන් පසු පස එලවා ගෙන ගොස් උන් මරා මස් අනුභව කරනවා දුටිමි.'

**බුදු රජාණන් වහන්සේ :**

'මහ රජ තුමෙනි, අනාගත කලියුග කාලයෙහි පාලකයෝ ද නිළධාරීහු ද අධාර්මික වෙති. පාලනයට නිළතල වලට පත්වීමට ඉතා සුදුස්සන්ව අධර්මයෙන් පරදවා නුසුදුස්සෝ ඒ තැන් වලට පත් වෙති. ඒ පාලකයෝ වැදගතුන්ට දමරිකයන් ලවා තර්ජන ගර්ජන කරවා තලා පෙලා හිංසා පීඩා කරවා ඔවුන්ගේ දේපල පැහැර ගනිති. ඉන් බිය පත්

වන්නෝ පදිංචිය අතහැර වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වෙත්. තවත් නොයෙක් අයුරින් ඔවුන් ව පෙළීමට පත් කරයි. මෙසේ නීචයන් විසින් වැදගතුන් ව තම ග්‍රහණයට ගෙන වනසති. ඒ අතරම රට වැසියෝ ණය බරින් ද මිරිකෙති. කුස ගින්නෙන් ලෙස රෝග වලින් ද පෙළෙති. ණයබර - බදුබර - කුසගිනි දරාගෙන රට වැසියා දුක් විඳින කල්හී පාලකයෝ සහ අනුගාමිකයෝත් ඔවුන්ට අවනත නිළධාරියෝත් මහ ඉහළින් වැජඹෙති.

එසේම අනාගත කාලයේ මාගේ ශාසනයෙහි සිටින අලජ්ජී දුස්සීල භික්ෂූන් සිල්වත් ශික්ෂාකාමී භික්ෂූන්ට නිකරුනේ බැණ දොඩා අවමන් කර වෙහෙස කරවා විහාරාම වලින් පන්නා ගනිති. සිව්පසයට ලොල් වූ ඒ පාප භික්ෂූන්ගේ වැරදි ක්‍රියා දකින ලැජ්ජා බිය ඇති භික්ෂූන් විහාරාරාම ඔවුන්ටම දී ඉක්ම යති. ඇතැම් භික්ෂූන් වන වදිති. මහ රජ තුමෙනි, ඔබ තුමා දුටු මේ සිහිනයේ අනිටු විපාක ද මෙසේ අනාගතයේ දක්නට ලැබෙන්නේ ය' යැයි තථාගත සර්වඥසම්මා සම්බුදු රජාණන් වහන්සේ කොසොල් මහ රජිඳාණන්ට සිහින ඵලාඵල විසඳා වදළ සේක.

## සිහින දහසය මෙතෙකින් කියා නිමවන ලදී.

ඉහත කී පරිදි කොසොල් රජතුමා මෙම සිහිනයේ දුටු අවස්ථා වල මල්ලිකා බිසව ද සමඟ බුදු රජාණන් වහන්සේ හමුවට ගොස් ඒ සිහින දන්වා, ඵලාඵල අසන්නේ ය. තුන් කල්හී සියළු ලෝ තතු අතැඹුලක් සේ දන්නා බැවින් සර්වඥවූ බුදු රජාණන් වහන්සේ එහි ඵලාඵලය මහ රජුට පහද වදරණ සේක. සර්වඥයන් වහන්සේ මෙම කරුණු පැහැදිලි කර දීම හේතුවෙන් සිදු වීමට ගිය මිනිස් සහ තිරිසන් මහා සත්ව ඝාතනය වැළකී ගියේ ය. පුරෝහිත බමුණන්ගේ අවස්ථාවාදීකම සහ කෛරාටිකකම පැහැදිලි වන්නේ ය. රජු මිසදුටුවෙන් මිදී සම්දිටුවට පත් වන්නේ ය.

ඒ සිහින ඵලාඵලයන්ගෙන් කියන ලද පරිදි කළියුගයට අප ද දැන් පා තබමින් සිටිනු දක්නට ලැබේ. සොළොස් මහ සිහිනවල කියන ලද පරිදි පාලක පක්ෂය ද මැති ඇමතිවරු සහ නිළදරුවන් ද සාමාන්‍ය ජනතාව ද ක්‍රමයෙන් අධර්මය වැළඳ ගනිමින් පවතින්නේ ය. පාපය බලවත් වීමට පත් වන්නේ ය. එහෙත් වර්තමානය සියයට සියයක්ම ඒ අතට පත්ව නැත. තවම මේ ඒ අතට පෙළගැසෙමින් පවතින අවස්ථාව ය. නමුත් මේ තත්වය යටතේ ද මිනිසාත් ලෝකයත් කෙතරම් නම් අභාග්‍ය සම්පන්න ද අසම්පත්තිකර ද?

## සිහි නුවණින් විමසන්න.

එද මේ සිහින දුටු කොසොල් රජතුමා ජීවත් වූ කාලයේ මනුෂ්‍යයාගේ පරමායුෂ වසර 120 ක් සේ සැලකේ. අද එය 76 ක් පමණ වේ. මේ වසර 2600 ක වෙනස ය. තව අවුරුදු 6000 කදී පමණ මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු 10 ට පහළ බසී. එකලට පාපය ඉතාම බලවත් වේ. අධර්මයම එකලට ප්‍රබල වේ. එකලට ධර්මයට ධර්මවාදියාට සමාජයේ තැනක් ලැබෙන්නේම නැත.

මේ සිහින ඵලාඵල එකලට සියයට සියයක්ම දක්නට ලැබෙන්නේ ය. අද ජීවත් වන අපට මුහුණපෑමට සිදු ව තිබෙන පරිදි පාපය, කාමරාගය, ක්‍රෝධය, ඊර්ෂ්‍යාව, මාන්නය, පලිගැනීම, තෘෂ්ණාව, ආත්මාර්ථකාමීත්වය අද එදට වඩා වැඩි ය. වෛද්‍යවරුන්ට සොයා ගැනීමට පවා නොහැකි වන රෝග පීඩාදිය මේ කාලයේ වැඩි වී තිබෙන්නේ ද මේ නිසා ය.

අසහනය, අසමගිය, අයහපත, පවුල් අවුල්, සමාජ විරෝධතා, විවිධ මතගැටුම්, යුද කෝලාහල බහුලව පවතින්නේ ද මේ හේතුවෙනි. මේ මෙලොව වශයෙන් මෙකල දක්නට ලැබෙන අනිටු විපාක ය. මරණින් මතු විපාක මීට වඩා අතිශය බලවත් ය. දරුණු ය. භයානකය.

අධර්මිෂ්ඨව පාපයට බරව නොමනාකම් කිරීමෙන් මරණින් මතු අනන්ත වර්ෂ ගණන් අනන්ත කල්ප ගණන් සතර අපා දුක් විඳීමට සිදු වන්නේ ය. නොමගින් උපයන ධනයෙන් විඳින සැපත තාවකාලික ය. එය වසර කිහිපයකට සීමා වේ. එනමුත් ඒ තුළින් සිදු වන පාප කර්මයන්ගේ දුක්ඛදායක අහිටු විපාක බොහෝ කාලයක් මුළුල්ලේ විඳවීමට සිදු වන්නේ ය. මෙපවත් දන්නා සර්වඥයන් වහන්සේ මිනිසා ඒ පාපකම් වලින් මුදවා සුමගට යොමු කරවීමට මහා කරුණාවෙන් දහම් දේශනා කළේ ඒ නිසා ය. අප ද කළ යුතු ඒ දහම දැන නොමගට බර නොවී සුමගට යොමු වී කටයුතු කිරීම ය. ඒ සඳහා අද අපි නුවණැති නොවුවහොත් මරණින් මතු ජීවිතය අතිශය දුක්ඛිත කටුක එකක් වනු ඇත.

එනිසා අප සියළු විටම දහමෙන් උපරිම ඵල ප්‍රයෝජන නෙළා ගත යුතු ය. මේ පොතපත සම්පාදනය කර බෙදා හැරීමේ අපගේ අරමුණ ද ඒ සඳහා ජනයා යොමු කරවීම ය.

කොසොල් රජු දුටු මේ සිහින කියවා සිනහ වී පොත පසෙකින් තැබීමවත් වර්තමාන පාලක පිරිසට දෙස් කීමවත් විශ්මය ඵල කිරීමවත් සඳහා අප මේවා ඔබට විස්තර කළේ නැත. හෙට දවසේ මෙකී පාලකයෝ අප විය හැකි ය. සසර හැටි එහෙම ය. මේ සිහින ඵල සමාජයේ සෑම අස්සක් මුල්ලක් පාසාම පැතිරී ගිය දට අප ද ඒ පාපී ගොඩට ඇතුළත් විය හැකි ය. මේ මොහොතේ කල්පනාකාරීව කටයුතු කළහොත් එම ළාමක පාපකම් තත්වයට බඳුන් නොවී ගැලවීමට අපට හැකියාව ලැබෙනු ඇත. අප කරන මේ මග පෙන්වීම ඒ සඳහා ය.

මාගේ වයස අවුරුදු 8 ක පමණ වන 1947 වර්ෂයේ වෙසක් සැරසිලි සඳහා ප්‍රධාන තැනක් ගත් අම්බලන්ගොඩ නගරයේ 'මාර්කට්

එකේ තොරණ' සඳහා කථා වස්තුව වී තිබුණේ මේ සිහින 16 ය. පසෙකින් ඇසෙන ගැහැණු ළමයෙකු විරිදුවෙන් කියනු ඇසෙන අර්ථ කථනයකින් සිහින 16 මැනවින් විස්තර වන්නේ ය. තොරණේ ඉහළ මාලයේ බුදු රජාණන් වහන්සේ සවණක් සන බුදු රැස් විහිදුවමින් දහම් දෙසනා සේක. පහත මල්ලිකා දේවිය සමඟ කොසොල් රජතුමා බණ අසන්නේ ය. ඊට පහළින් කොටු 16 ක සිහින 16 දිස් වේ. විදුලි බුබුලෙන් බැබලෙන තොරණ අත්‍යාලංකාර ය.

ඒ සියල්ල උපයෝගී කරගෙන ලබා දුන්නේ දැවැන්ත දහම් පණිවිඩයකි. එද කුඩා දරුවෙකු වූ මගේ සිතේ ඒ දහම් පණිවිඩය මැනවින් තැම්පත් විය. වසර 76 ක් වන අද දවසේ මෙවැනි දහම් පොතක් සම්පාදනය කිරීමට ද ඉවහල් වූයේ ඒ සුමිහිරි මතක සටහන ය.

එද පොදු වෙළඳ පොල පුරාම දන්සැලක් පැවැත්විණි. විවිධ බණ කථා රූකඩ මගින් නිරූපනය කරන ලදී. ඒවා අතිශය හැඟීම් බර ය. ගාලු දිස්ත්‍රික්කයේ හිණිදුම් පත්තුවේ ඉතා පිටිසර ගමක් වූ මාවිට (කොස්වත්තේ) උපන් මා එද පියා සමඟ වෙසක් බැලීමට පැමිණියේ ඇඹලේගෙදර හබරකඩ හරහා හත්තකට සැතපුම් 12 ක් පා ගමනින් ගොස් එතැන් සිට බසයෙන් ඇල්පිටියටත් ඇල්පිටියේ සිට අම්බලන්ගොඩටත් පැමිණිමෙනි. ඒ දුෂ්කර ගමනින් මා ලද සුමිහිරි මතක සටහන මගේ ජීවිතය ඉතා දැහැමි එකක් බවට පත් කර ගැනීමටත් අද මේ උතුම් පැවිද්ද ලැබීමට ද හේතු වූවා සේම ඔබ සැමට ද මේ දහම් පොත කියවීම ඉතා දැහැමි ජීවිතයකට මාර්ගෝපදේශයක්ම වේවා!

2011 මාර්තු මස 8 වැනි අඟහරුවාද ලංකාදීප

# දිළිඳුකමෙන් මිදෙන්න කුවේට් ගිය අවිවාහක කත මාස 5 කට පසු ගැබිනියකව ගෙදර ඇවිත්

(ගල්ගමුවේ නිහාල් ජයවීර)

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පදිංචිකාරියක වූ ඇය කුවේට් රටේ ගෘහ සේවිකාවක ලෙස රැකියාවක් කිරීමට ගියේ බොහෝ බලාපොරොත්තු සහිතවය. ඒත් මේ අවිවාහක තරුණියට මාස පහකින් ආපසු මවුබිමට පැමිණීමට සිදුව ඇත්තේ දරු ගැබක් ද සමඟය.

ඒ කඳුළු කථාව ඇය විස්තර කෙළේ මෙසේය.

''අපි හරිම දුප්පත්. ඒ නිසාම මගේ අම්මත් රට ගියා. මාත් ගොඩක් දුක්වින්ද. හරියට රස්සාවක් නෑ. ඇඳුමක් පැළඳුමක් නෑ. ගමේ හිටියට වැඩකුත් නෑ. ඒ නිසා මමත් රට යන්න හිතුවා. කුරුණෑගල නගරයේ විදේශ රැකියා ආයතනයකට මුදල් බැඳලා 2010 අවුරුද්දේ අප්‍රියෙල් මාසේ අටවැනිද මං කුවේට් රටට ගියා''

මට වැඩ කරන්න ලැබුණේ කුස්සියේ. මං ඒ ගෙදර වැඩට ගිහින් ටික දවසකින් ගෙදර අයිතිකාර නෝනයි, මහත්තයයි, ළමයිනුයි ඇමරිකාවේ සංචාරයකට ගියා. ගෙදර ඉතිරි වුණේ මම වගේම ගෘහ සේවිකාවන් ලෙස කටයුතු කරපු පිලිපීන හා ඉතියෝපියානු කාන්තාවන් දෙන්නෙකුයි, රියැදුරු ලෙස කටයුතු කරපු ඉන්දියා ජාතිකයෙකුයි, ඒ ගෙදර නෝනාගේ වයසක අම්මයි විතරයි. මං වැඩ කළේ නිවසේ පහළ තට්ටුවේ.

''ගෙදරට උයන්න අවශ්‍ය දේවල් එහෙම ගෙනත් දෙන්නේ අර රියැදුරා. අපට පාරටවත් යන්න බෑ. කුණු දන්න ගියත් ගේට්ටුව ඇරලා

දෙන්නේ ඒ රියැදුරා. මට උඩ තට්ටුවටවත් යන්න දෙන්නේ නෑ. ඒ උඩ තට්ටුවේ වැඩ කරන්නේ අනිත් සේවිකාවන් දෙදෙනා''

දවසක් ඉන්දියා ජාතික රියැදුරා බඩුමල්ලක් දෙන ගමන් මගෙ අතින් අල්ලාගෙන එයාගේ කාමරයට ඇදගෙන ගිහින් මට අතවර කළා.මං කොච්චර කෑගැහුවත් පිටට ඇහෙන්නේ නෑ. ඒ මිනිහා මාව විනාශ කළා. දෙතුන් අවස්ථාවකම මට මේ විදිහට ඊට පස්සෙත් අතවර කළා. කියන්න කෙනෙකුත් නෑ.''

මාස තුනකට පස්සේ තමයි ගෙදර අයිතිකාරයන් ආවේ. මං මේ ගැන නෝනාට කීවා. නෝනා මා රෝහලකට අරන් ගියා. රෝහලෙන් පරීක්ෂාකරලා කීවා මට බබෙක් හම්බවෙන්න ඉන්නවා කියලා. ඊට පස්සේ ඒ නෝනා එහේ තියෙන ඒජන්සියට දැනුම් දුන්නා. ඒජන්සියෙන් දෙන්නෙක් එවලා මා ඒජන්සියට අරන් ගියා. ඒකේ සති දෙකක් විතර හිටියා. මා වෙන ගෙදරක වැඩටත් දැම්මා. දවස් කීපයක් වැඩ කරන කොට ආයි ඒජන්සියෙන් ඇවිත් මා රෝහලකට අරන් ගිහින් දැම්මා. මුලින් හිටපු ගෙදර නෝනාට මගේ කුසට මාස කීයක්ද කියලා දැනගන්නලු එහෙම කළේ.''

ඒ රෝහලේ දවස් පහළොවක් විතර හිටියා. එහෙම ඉන්න කොට අර නෝනා මගේ ''පාස්පෝට් එකයි'' ටිකට් එකකුයි රෝහලට ගෙනත් දුන්නා. රෝහලෙන්ම මා ගුවන් තොටුපොළට ගෙනත් දැම්මා. මගේ මාස දෙකක පඩියත් ලැබුණේ නෑ. එහේ ඒජන්සියේ මගේ ඇඳුම් බෑග් දෙකකුයි ජංගම දුරකථනයයි තියෙනවා. ඒවා මට ලැබුණේ නෑ.''

මං රට ගියේ සල්ලි ටිකක් හම්බ කරගෙන ඇවිත් විවාහයක් කරගෙන හොඳ ජීවිතයක් ගත කරන්නයි. දැන් මට වයස අවුරුදු විසි හයයි.

ඒ ඔක්කොම අද මට අහිමි වෙලා. දැන් කුසට මාස තමයයි. මට මේ දරුවා විනාශ කරන්න බෑ. හිඟා කාලා හරි දරුවා ජීවත් කරන්නයි මගේ අදහස. මේ ඔක්කොම සිද්ධ වුණේ අපේ නැතිබැරිකම නිසා. මං අනාචාරයේ හැසිරිලා මෙහෙම දෙයක් කරගත්තේ නෑ. එහෙම කළා නම් දරුවෙකු කුසේ මෝරන්න දෙන්නේ නෑ. හැමදෙයක්ම දුප්පත් අපට තමයි. විඳවන්න සිද්ධ වෙන්නේ''

එම කාන්තාවගේ පියා මෙසේ කීවේය.

''දුවට මේ කරදරය වුණා කියලා මට දැන්වූවාට පස්සේ මං කුරුණෑගල ඒජන්සියට ගියා. ඒජන්සියෙන් මට කීවේ ළමයා මරයි. පෙට්ටියේ ගෙදර එවයි. ඒ නිසා සල්ලි දෙන්න ගෙනත් දෙන්නම් කියලා. ඒජන්සියෙන් ඉල්ලපු තරම් මුදලක් මට කොහොමටත් හොයාගන්ඩ බැරිවුණා. ඊට පස්සේ විදේශ රැකියා සේවා නියුක්ති කාර්යාංශයට දැන්වුවා. මං එතෙන්ට තුන්පාරක් ගියා. දුවට වන්දියක් ලබාදෙන ලෙස මං ඉල්ලා සිටියා. ඒත්  ඒකට කිසිම ක්‍රියා මාර්ගයක් ගත්තේ නෑ. ඒ අය මේ ගැන හොයලා බලන්නේ නෑ''

දැන් තියෙන ප්‍රශ්නය තමයි මේ ඉපදෙන්ඩ ඉන්න දරුවා හදගන්නේ කොහොමද කියන එක. අපි හරිම දුප්පත්. දුවගේ අනාගතයයි, මේ ඉපදෙන්න ඉන්න දරුවාගේ අනාගතයයි ඔක්කොම රැකදෙන්නේ කොහොමද. අපි පත්වෙලා ඉන්න තත්ත්වය ගැන බලලා දුවව රට යවාපු ඒජන්සියෙන් හෝ අදාළ වෙනත් තැනකින් හෝ වන්දියක් ලබාදීමට කටයුතු කරනවානම් හොඳයි.

## නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස!!!

# පසුවදන් ධර්ම දේශනාව

පිංවත්නි,

මෙම දහම් ග්‍රන්ථය තුළින් ඉතා දීර්ඝ සංවේගජනක ධර්ම පණිවිඩයක් දීමට මාතෘකාව තිබුණත් සිහින දහසයත්, ඉතා අනුවේදණීය පුවත් තුනකුත් තිබෙන නිසාත් මෙම ධර්ම ග්‍රන්ථය මෙතෙක් දුරට ගෙනඒමට දයක වූ ලොකු පිරිසකුත් සිටියත් සඳහන්ව තිබෙන නම් හැර වෙනත් නම් යොදවන්නේ නැත.

කෙටි දේශනාව නම් හතර අපායට සමාන දුකක් දෙන ස්ත්‍රීව ඉපදීමේ සංවේග පණිවිඩයක් තමා මෙයින් දෙන්නේ. එනම් එද මෙයට 20 අසංඛ්‍ය කල්පයකට ඉහත දී අති දීර්ඝකාලයකින් බුද්ධ කියන වචනයක්වත් අසන්ට නොලැබුණු මේ දුක් සසර ගමනේ පඤ්ච සුද්ධාවාස ක්ෂය වෙමින් යන කාලයේදී අකනිට්ඨා බ්‍රහ්ම ලෝකයෙ, මහාබ්‍රහ්ම රාජයෙක්, බුදුරජාණන් වහන්සෙ නමක් ලෝපහළ නොවීමේ දුකෙන් ඒ වෙනුවෙන් (බුදු බව පතන්න) යොමුකිරීමටවත් සුදුසු පුද්ගලයෙක්වත් ලෝකයෙ සිටින්දැයි සොයා බැලීමේදී මහා එඩිතර වීර පුරුෂයෙකු සත්දිනක් දිවා රාත්‍රී නොබලා, වෙහෙස මහන්සියක් සා, පිපාසාවක් නොබලා තම මෑණියන් වහන්සේ පිටමත තබා පරක් තෙරක් නොපෙණන මහා සාගරයෙහි පිහිණනු දැක මහත් සතුටට පත්ව එම වීරපුරුෂයා බුදු බව පතන උත්තමයකු බවට පත් කළෝය. එතෙක් මෙතෙක් විසිඅසංඛ්‍ය කල්පයකට පසු ගෞතම සම්මා සම්බුද්ධත්වයට

පත්ව 24 අසංඛයක් සත්වයෝ සංසාර දුකෙන් මිදූ අපගෙ බුදුපියාණන් වහන්සේම ය.

මේ සසර වනාහි, ඉතා අව්‍යාවස්තිතය, ඉතා භයන්කාරය, ඉතා සාදිනවය, ඉතා ව්‍යාකූලය, ඉතා දිගය, එතෙර විය නොහැකිය, ඒ කෙසේද යත් කේෂර සිංහ රාජයො ගම් ඌරො වෙති, මහා බ්‍රහ්මයො කණාමැදිරියො වෙති. සක් දෙවිඳු චණ්ඩාලයො වෙයි. සාගරයෙහි වසන තල්මත්ෂ්‍යයින් ගැඩවිල් පණුවන් වෙති. මහා බලගතු රජවරු කුලී වැඩ කරණ වහල්ලු බවට පත්වෙති.

එය සනාථ කිරීමක් වශයෙන් ඉහත සඳහන් කරන ලද වීර පුරුෂොත්තමය, සත්දිනක් මව පිටමත තබාගෙන පිහිණුවා හා සමාන ඊළඟ ආත්මභාවයෙ තම කුසින් බිහිකල දරුවන් දෙදෙන අධික කුසගින්න නිවා ගැනීම පිණිස, ගොදුරු කර ගැනීමට සූදනම්වන දර්ශනය දැක අවබෝධ කරගෙන ''අහෝ, මේ සසර භිය, දුක, වේදනාවට ශාපවේවා, සිතා තමාගෙ ශරීරය එම ව්‍යඝී දෙනුවට ආහාරය වේවායි පතා ප්‍රපාතයට පැන තම ශරිර මාංශ දන්දුන් එම වීර උත්තමයා ඊළඟ භවයකදී කාන්තාවක් වී ඉපදීමට දූන හෝ නොදූක (ඉටිකුමාරි) කරගත්තා වූ කර්ම විපාකයක් හේතු වුණා නම් අප වැන්නවුන්ට කවර කථාද?

එසේම එම කාන්තා ආත්මයෙන් මිදී සම්බුද්ධත්වය දක්වා නොපසුබට උත්සාහයෙන් ඒසා අතිදීර්ඝ කාලයක් සසර අහෝ දුකයි සසර භියයි සසරින් මිදීමම සැපයි කියා රැඳුනේ සැපක් සොයා නොව

අපත් එම දුකෙන් මුදවා තවත් ඉදිරියට අපමන සත්ව සන්තතියකට නිවනේ දොර විවෘතව තබා නිවනට වැඩියෙ ධර්මය අපට දායාද කරයි. එම ධර්මයෙ මෙසේ සඳහන් වේ. මේ විශ්වයෙ එකම පිරිමියෙක් හෝ ස්ත්‍රී ආත්මභාවයක් ලබා නොගත්තෙක් නැත. එසේම එකම ස්ත්‍රියක් හෝ පුරුෂ ආත්මයක් ලබා නොගත්තෙක් නැත. එම දහම පිහිටාධාර කරගෙන කෙතරම් නම් කාන්තා සංඛ්‍යාවක් නිවන්පුරයට වැඩියාද? අද දක්වාත් එම ධර්මය පිහිටාධාරකර ගෙන, කොතරම් ස්ත්‍රී සංඛ්‍යාවක් ස්ත්‍රී ආත්මයෙන් මිදී පුරුෂ ආත්ම පතාගෙන සසර ගමන් කරනවාද? ස්ත්‍රී ආත්මයෙන් මිදෙනවාද? මේවා ගැන සිතා භාවනා කරන්න.

දැන් ධර්ම ග්‍රන්ථයට ඇතුළත් කර තිබෙන ප්‍රවෘත්ති තුන දෙසට යොමුවෙමු. එකක සඳහන් වෙනවා අවුරුදු 8 ක කිරිකැටි දුවක් අවුරුදු 40 ක පුද්ගලයෙකුට විවාහ කරදීමක් අනෙක පෙන්වා පෙරදිග ධාන්‍යාගාරය, පෙරදිග මුතු ඇටය, ලෝකයෙ උතුම් රට උපන් තරුණියකට තිබෙන දූඩි දරිද්‍රතාවය, දුප්පත්කමේ අසහනය, ස්ත්‍රියක් වී ඉපදීමේ ශාපය නිසා වූ විපත මේවාට පිළියම් තිබෙනවාද? එවන් පුවත් දකින දැක්කම සිත උණුවන පාලකයින් සිටිනවාද? සත් ගුණවත් ආයතීවන් සිටිනවාද? එකී පුවත් දෙකේ දුක්බර වේදනාවන්ට ගොදුරු වූ ස්ත්‍රීන්ට මෙන්ම උප්පලවන්නා මහ රහත් තෙරණීන් වහන්සේටත් අතීත භවයකදී

කරගෙන තිබෙන පාපකර්ම විපාකයක් එලදීම වශයෙන් රහත් භාවයට පත්වූ අන්තිම භාවයේදී සල්ලාලයෙකුගෙන් මිදීමට බැරිවූ සේක්, මෙවැනි අභිංසකයින්ට වුන විපතවන් තවත් ඉදිරියට වන විපත් වෙනුවෙන්වත් ක්‍රියාකරන පාලකයන් කවද මෙරටට පහළවෙත්ද? මානව හිමිකම් ගැන සොයන ඇමතියන් පහළවෙත්ද? බලකාමයෙන්, ධන කාමයෙන්, මත්වී සිටින සියළුම දෙනාට මාගෙ 76 වන උපන්දිනය වෙනුවෙන් දෙන ධර්ම දනයයි මෙය කියවා ධර්මය අවබෝධ කරගෙන සසරින් මිදීම පිණිස එකී පුවත් දෙක්හි සඳහන් වූ කාමඅපරාධකරුවන්ටත් මෙතෙකෙයි කියා නිමකල නොහැකි සසර අපා අටමහ නිරයන්හි සහ අනේකවිද දුක් විඳවා නැවත මිනිසත් භාවයක් ලබාගෙනත් පණ්ඩව, නපුංශකව, පිළිකුල් විරූපී ස්ත්‍රී ආත්ම භාවයන්ට ගොදුරුවන්න ලැබෙන වාරගණන් නිමක් නැති නිසා ඔවුන්ට ද්වේෂකර, පාලකයින්ට ද්වේෂකර, සමාජයට ද්වේෂකිරීම නොව එක් මහා කල්පයක් තුළ තිබෙන අතුරු කල්ප 20 න් හයකට පමණ වාර ගණනක් සත්‍ර විනාශයෙන් ආවිස ගෙවන අතුරු කල්ප තුළ සිදුවන දේ තමයි එද කොසොල් මහ රජතුමාට සිහිනෙන් දර්ශණය වූවේ.

මෙය ස්ත්‍රී රත්නයට අපහාස කිරීමක් නොව යථා තත්ත්වය පෙන්වාදීමයි මා විසින් කරන්නේ මෙම ග්‍රන්ථය මාගේ 14 වන දහම් ග්‍රන්තයයි 2 වන දහම් ග්‍රන්ථය වන යශෝධරා දහම් ග්‍රන්තයෙන් කාන්තා

රත්නයෙ ශක්තිය බලය මැනවින් පෙන්වා ඇත. එසේම කොසොල් මහ රජතුමා තම උපදේශකයන්ගේ දිරච්ච ලණු කැමෙන් බේරා ගත්තේද මල්ලිකා බිසවයි, විශාඛා උපාසිකාව මිත්‍යාදෘෂ්ටි මිගාර මාතාවක් වූවා සේම ඔබතුමියගෙන් වන සේවයත් එසේම වේවායි පතමි.

දුෂ්කරතා රාශියක් මධ්‍යයෙ නමුත් මෙම දහම් ග්‍රන්ථය හදිසියේම මුද්‍රණය කිරීමට යොමු වූයේ නව විදේශ සේවා ඇමතිතුමියගෙ විශේෂ අවධානය යොමු කිරීම සඳහායි. විශේෂයෙන්ම එතුමියට සුබ ප්‍රාර්ථනා කර වර්ණයෙන් පුවත්පත් පිටුවක්ම විශාල මුදලක් වැඩකර ආශිර්වාද කල පිරිසම අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයෙ දුගී තරුණියගෙ දුකට දයක වූ ඒජන්සි මහත්වරු ගැනත් අපට සාධාරණ සැකයක් තිබෙන නිසා අවස්ථාවාදීව ටයි, කෝට් මාරු කරන මහත්ම මහත්මීන්ට ඔබ තුමියත් රැවටුණොත් ගම්බද දුගී දුප්පත් කාන්තාවන්ට සල්ලාලයින්ගේම පිහිට හැර අන් සරණක් නැත්තේමය. පසුගිය කාලයෙ විදේශ රැකියා සඳහා දිවයිනෙන් පිටවූයෙම ගුවන් තොටුපල සල්ලාලයින්ගෙ ගොදුරු බවට පත් විය.

# සේවකයන්ට කාර් බෙදූ ව්‍යාපාරිකයා කාන්තාවන් 111ක් දෑවැද්දත් එක්ක බන්දා දීලා

පිය සෙනෙහස අහිමි වීම නිසා විවාහවීමේ ආර්ථික අපහසුකම්වලින් පෙළුණු ඉන්දීය තරුණියන් සිය දෙනෙකුට විවාහවීමේ අනුග්‍රහය දැක්වූ දියමන්ති ව්‍යාපාරිකයෙකු ගැන වාර්තා වේ. මහේෂ් සවානි නම් මේ පුද්ගලයා කාන්තාවන් 111 කට විවාහවීමේ සාමුහික උත්සවය සංවිධානය කොට දුන් අතර එක් අයකුට ඉන්දීය රුපියල් ලක්ෂ හතරහමාරක් වටිනා රත්තරන් සහ රිදී ආභරණ, විදුලි උපකරණ, ඇඳුම් පැළඳුම් සහ විවාහයට අදළ අනෙකුත් වියදම් ද ලබා දීමට පියවර ගත්තේය. මින් නොනැවතී දරු ප්‍රසූතිය වැනි අවස්ථාවලදී අවශ්‍ය වියදම් ද ලබා දෙන බව ඔහු වැඩිදුරටත් පොරොන්දු විය. තම දියණියන් දෙදෙනා විවාහ කරදීමට නොහැකිව දිවි නසාගත් සේවකයකු ගැන ඇති කණගාටුදයක මතකය නිසා මේ සඳහා පෙළැඹුණු බවද ඔහු මාධ්‍ය වෙත අදහස් පළ කළේය.

මෙවන් සත්ගුණවත් උත්තමයින් ශ්‍රී ලංකාවෙන් බිහිවේවා අපටත් මෙම දහම් ග්‍රන්ථය මුද්‍රණය කිරීමට ප්‍රමාදවූයේ එම නිසා බවත් අවබෝධ වේවා.

මව්බිම 3-12-2014

## වයස අවුරුදු 8 දැරියගේ මංගල්‍යයට පසු දින දැරිය මියයයි



23-09-2013 "මව්බිම"

## දෙවන සිහිනයට සම්බන්ධයි

අනන්ත දුක් සංසාරයේ මාගේ මව වී, සහෝදරිය වී, හිතවතිය වී, බිරිඳ වී එක්වන්නට ඇත්ද? මනමාලියකගේ මුහුණේ තිබෙන සතුටක් ද තිබෙන්නේ? තවත් කොපමණ දුරක් මැරි, මැරි ඉපදී, ඉපදී පෙර දැන හෝ නොදැන කරගත්තා වූ අකුසල කර්ම විපාකයෙන් කවදා මිදෙත් ද? අපට මෙවන් ඉරණමවල් අත් නොවෙත් ද?

දියණියක සේ සිතන්න පුරුදු වන්න.

# සේවකයන්ට කාර් බෙදූ ව්‍යාපාරිකයා කාන්තාවන් 111ක් දෑවැද්දත් එක්ක බන්දා දීලා



පිය සෙනෙහස අහිමි වීම නිසා විවාහවීමේ ආර්ථික අපහසුකම්වලින් පෙළුණු ඉන්දීය තරුණියන් සිය දෙනෙකුට විවාහවීමේ අනුග්‍රහය දක්වූ දියමන්ති ව්‍යාපාරිකයෙකු ගැන වාර්තා වේ. මහේෂ් සවානි නම් මේ පුද්ගලයා කාන්තාවන් 111 කට විවාහවීමේ සාමූහික උත්සවය සංවිධානය කොට දුන් අතර එක් අයකුට ඉන්දීය රුපියල් ලක්ෂ හතරහමාරක් වටිනා රත්තරන් සහ රිදී ආභරණ, විදුලි උපකරණ, ඇඳුම් පැළඳුම් සහ විවාහයට අදාළ අනෙකුත් වියදම් ද ලබා දීමට පියවර ගත්තේය. මින් නොනැවතී දරු ප්‍රසූතිය වැනි අවස්ථාවලදී අවශ්‍ය වියදම් ද ලබා දෙන බව ඔහු වැඩිදුරටත් පොරොන්දු විය. තම දියණියන් දෙදෙනා විවාහ කරදීමට නොහැකිව දිවි නසාගත් සේවකයකු ගැන ඇති කණගාටුදායක මතකය නිසා මේ සඳහා පෙළැඹුණු බවද ඔහු මාධ්‍ය වෙත අදහස් පළ කළේය.

මෙවන් සත්ගුණවත් උත්තමයින් ශ්‍රී ලංකාවෙන් බිහිවේවා අපටත් මෙම දහම් ග්‍රන්ථය මුද්‍රණය කිරීමට ප්‍රමාදවූයේ එම නිසා බවත් අවබෝධ වේවා.

03-12-2014 "මව්බිම"

මුද්‍රණය : තිරසවි ප්‍රින්ටර්ස් 0112 569192, 077 9620359